මුලටියන ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.
-------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිත්‍යාගයක් ලෙස ලැබුණු රු.499,991 ක් වටිනා යන්ත්‍ර, සහ මිලදීගෙන තිබූ රු.549,780 ක් වටිනා ලී බඩු උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු රු.356,350 ක් වටිනා ඉඩම් ගොඩනැඟිලි සහ විවිධ ප්‍රතිපාදන යටතේ රු.4,065,764 ක් වටිනා ඉදිකිරීම් හා නවීකරණයන් කිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට පොදු සැපයුම් ණයහිමියන් රු.66,178 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර අසමානතාවල එකතුව රු.35,764,191 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමානතාවයන් බැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට නොවෙනස්ව ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ පවතින රු.36,289 ක බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | කාලයක් තිස්සේ පැවත එන ශේෂයක් බැවින් සොයාගත නොහැක. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.127,491,823 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | | |
| | (i) | රීති 143 | ආපසු ගෙවියයුතු තැන්පත් ලෙජරයේ මාසික එකතුව ප්‍රධාන ලෙජර ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පතු ලෙජරයේ මාසික එකතුව ප්‍රධාන ලෙජරයේ ගිණුම සමඟ නොගැලපීම කාලයක් තිස්සේ පැවත එන්නකි. |
| | (ii) | රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම්, අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (iii) | රීති 203 හා 204 | පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (iv) | රීති 213 | සභාවේ ලේකම්වරයා අත්සන් කරන ලද නිකුත් කිරීමේ නියෝගයක් නොමැතිව ගබඩා භාණ්ඩ නිකුත් කර තිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) | මු.රෙ.110 | හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී හානි පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ.571 | රු.137,850 ක කල් ඉකුත් වූ තැන්පතු 18 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (iii) | මු.රෙ.396 | නිකුත් කර මාස 06 කට වැඩි කාලයක් ඉක්මවූ රු.35,964 ක් වූ චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අදාළ කාලය ඉක්ම වූ වහාම චෙක් පත් ආදායමට ගැනීමට කටයුතු කරමි. |

**2.** <u>**මූල්‍ය සමාලෝචනය**</u>

**2.1** <u>**මූල්‍ය ප්‍රතිඵල**</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,673,497 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.12,685,046 ක් විය.

## 2.2 <u>ආදායම් පරිපාලනය</u>

### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 626,000 | 1,393,058 | 1,393,058 | 76,231 | 281,000 | 22,342 | 15,892 | 76,231 |
| කුලී | 4,445,600 | 4,963,939 | 4,057,086 | 1,385,184 | 4,166,200 | 4,547,260 | 4,592,409 | 478,331 |
| බලපත්‍ර ගාස්තු | 1,100,540 | 597,502 | 597,502 | 10,450 | 1,131,300 | 1,746,206 | 1,746,206 | 10,450 |
| වෙනත් ආදායම් | 12,188,750 | 12,482,503 | 10,653,369 | 16,747,208 | 16,670,500 | 15,716,053 | 13,666,819 | 14,918,074 |
| එකතුව | 18,360,890 | 19,437,002 | 16,701,015 | 18,219,073 | 22,249,000 | 22,031,861 | 20,021,326 | 15,483,086 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **අක්කර බදු** | | |
| ආරම්භක හිඟය රු.76,295 ක් වූ අතර, රු.22,298 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.98,593 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.15,065 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.83,528 ක හිඟ ශේෂයක් පැවතුණි. හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | දේපල සමීක්ෂණයක් කර හිඟ අක්කර බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආරම්භක හිඟය රු.478,331 ක් වූ අතර, රු.4,963,939 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.5,442,270 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.4,057,086 ක් වූ නිසා, වර්ෂය අවසානයට රු.1,385,184 ක් හිඟව පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරි කාර්යාලයේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පවත්වාගෙන යනු ලබන රන්සැගොඩ උප කාර්යාල ගොඩනැගිල්ලෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.40,000 ක බදු කුලී අයවී නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු කඩ කාමර 41 න් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කුලී හිඟය රු.598,907 ක් වූ අතර එම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාගම් 03 ක් විසින් ස්ථාපිත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 03 ක් වෙනුවෙන් එම කුළුණු ස්ථාපිත කර තිබූ දින සිට මේ දක්වා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | අයවිය යුතු බලපත්‍ර ගාස්තු පිළිබඳව ලිඛිතව දැනුම් දී ඇත. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,087,273 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,649,999 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් දක්වා උපලේඛන අනුව රු.50,585 ක උසාවි දඩ ලැබිය යුතුව ඇත. උපලේඛන ලැබී ඇති මුද්දර ගාස්තු අනුව 2017 අප්‍රේල් මාසය දක්වා හිඟය රු.3,551,240 කි. මුද්දර ගාස්තු උපලේඛන 2017 අප්‍රේල් මාසයෙන් පසු ලැබී නැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 03 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 03 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | අතිරික්ත තනතුර අනුමත කර ගැනීම සඳහා දකුණු පළාත් සභාව වෙත යවා ඇත. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව බදුකරු ගිවිසුම් කොන්දේසි කඩකිරීම හේතුකොටගෙන ගිවිසුම අවලංගු වූ අවස්ථාවක නැවත ටෙන්ඩර් කැඳවා නව බදුකරුවන් වෙත බදු දීම කළ යුතු වුවද සභාව විසින් කඩකුලී නොගෙවූ කඩ හිමියන් 10 දෙනෙකුගෙන් කඩකාමරවල යතුරු භාර ගැනීම පමණක් සිදු කර තිබුණි. | ගිවිසුම් කඩ වූ අවස්ථාවක ගිවිසුම අවලංගු කොට නැවත ටෙන්ඩර් කිරීම් කළ යුතුවේ. | මාකඳුර පොදු වෙළඳ පොළ කඩ කාමර 10 ක හිඟ කුලී පවතින අවස්ථාවේ යතුරු භාර ගැනීම හේතුවෙන් ලේඛන වල හිඟ මුදලක් පෙන්නුම් කරන අතර ඉතිරි කඩ කාමර 13 හි හිඟ කඩකුලී අයකර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක ගොම්බන්දල සතිපොළ පවත්වාගෙන යාම සඳහා 2015 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන යටතේ පොළ භූමියේ කැටගල් ඇල්ලීමට රු.380,921 ක වියදමක් දරා තිබුණ නමුත් මේ දක්වා පොලෙන් ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | පොළ සක්‍රීයව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2017 වර්ෂය සඳහා ටෙන්ඩර් කර ඇති නමුත් කිසිවෙකු ටෙන්ඩර් භාරගෙන නැත. 2018 වර්ෂයේ දී ටෙන්ඩර් කර නොමැති අතර 2019 වර්ෂයට නැවත පොළ පවත්වාගෙන යාම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දකුණු පළාත්, පාලන කොමසාරිස්ගේ අංක දපපා/15 හා 2007 මාර්තු 19 දිනැති චක්‍රලේඛ ප්‍රකාර සභාව සතු ඉඩම්වල මායිම් සකස්කර අදාළ ඉඩමේ සභාවේ නම ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිරවුල් කර ගත යුතු ඉඩම් නිරවුල් කර ගැනීමෙන් පසුව සභාවේ නම ප්‍රදර්ශනයට කටයුතු කරන අතර අළුතින් සභාවට පවරා ගන්නා ඉඩම් වල සභාවේ නම ප්‍රදර්ශනයට කටයුතු යොදා ඇත. ඊට අවශ්‍ය ඇස්තමේන්තු සකස් කිරීමට තාක්ෂණ සේවා නිලධාරී වෙත යොමු කර ඇත. |

**3.3.2 නිශ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු අක්කර 01 පර්චස් 40 ක ප්‍රමාණයකින් යුත් ඉඩම් 02 ක් ඵලදායී කාර්යයක් සඳහා යොදා නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි ඵලදායී කටයුතු සඳහා යොදාගත යුතුවේ. | අදාළ ඉඩම්වල මායිම් නිරවුල් කර කුරුඳු පැළ සිටුවීමට සහ ගොඩනැඟිලි බහු කාර්ය ගොඩනැඟිලි ලෙස සංවර්ධනය කිරීමට කටයුතු සිදු කරමින් පවතී. |

**3.4** <u>**හඳුනාගත් පාඩු**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුලී පදනම මත ලබාදී තිබූ ජංගම කුටි 03 ක උපකරණවල වටිනාකම රු.89,386 ක් වූ අතර එම උපකරණ සභාවට භාරදී නොතිබීම නිසා 2019 පෙබරවාරි 20 දින වන විට රු.20,000 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඉතිරි මුදල වූ රු.69,386 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි මුදල් කඩිනමින් අය කළ යුතුවේ. | ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකිරීමට කටයුතු කරමි. |

**4.** <u>**ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**</u>

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 07 ක ඉතිරිවීම් වල එකතුව රු.5,706,507 ක් වූ අතර එම අගයන් සියයට 08 සිට සියයට 40 දක්වා පරාසයක පැවතුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී එක් එක් වියදම් ශීර්ෂයෙන් සිදුකළ හැකි නිශ්චිත වියදම් පිලිබඳ විස්තරයක් ඇතුළත් කර ඇති අතර ආදායම් සම්බන්ධයෙන්ද විස්තර ඇතුළත් කර මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අදායම් විෂයන් 02 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.654,263 ක් වූ අතර එම අගයන් සියයට 46 සිට 63 දක්වා පරාසයක පැවතුනි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී එක් එක් වියදම් ශීර්ෂයෙන් සිදුකළ හැකි නිශ්චිත වියදම් පිළිබඳ විස්තරයක් ඇතුළත් කර ඇති අතර ආදායම් සම්බන්ධයෙන්ද විස්තර ඇතුළත් කර මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගේ එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු සිදුකළ යුතුවේ. | අභ්‍යන්තර විගණන නිලධාරීට රාජකාරි ලැයිස්තුවක් පවරා නොමැති අතර වෙනත් රාජකාරිද ඇතුළත්ව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමටද පවරා ඇත. අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ක්‍රියාකර මාසිකව, ත්‍රෛයිමාසිකව, අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව අභ්‍යන්තර විගණන වාර්තාව කළමනාකරණය වෙත ඉදිරිපත් කිරීම පමණක් සිදුකර ඇත. |